## 1.0 හැඳින්වීම

අවකාශය යනු මානව ජීවන පැවැත්මේ අතිශය වැදගත් සංකල්පයකි. මෙය මානව සංහතියේ සම්භවයේ සිට අද දක්වා ද අනාගතයට ද මිනිසාගේ කායික හා මානසික වැඩීමත් සමග දිගින් දිගට පවතී. වානරයාගේ සිට මානවයා දක්වා ද ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ සිට අද සිටින දියුණු මානවයා දක්වා ද මනුෂ්‍ය සංහතිය පරිණාමය වන්නේ මෙම අවකාශ පදනම් කර ගනිමිනි. අවකාශ ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක වශයෙන් ප්‍රභේද වන අතර මිනිසුන් තුළ පවත්නා අවකාශ සාර්ථක වීම සමාජයේ තිබී පැවැත්මට ඇවැසි වේ. එනම් එදා සිට අද දක්වාම ඔහු මේ පැමිණ සිටින්නේ තම අවකාශ සාර්ථකත් කර ගැනීම හරහා ආ දිග ගමනකි. එහිදී එක් එක් යුගයන් තුළ විවිධ සමාජ ආර්ථික භූමි නිර්මාණය වන්නේ, එම අවකාශයන් සාර්ථකත් කර ගැනීමේදී ඇති වූ වර්ධනාත්මක තත්වයන් හා ඒවා වඩාත් ඵලදායීව ඉටුකර ගැනීම සඳහා නිර්මාණය කරගත් භූමිවේදයන්ගේ ප්‍රතිඵලයක් වශයෙනි.

යෞවනය යන්න ද මානව සංහතිය තුළ සුවිශේෂී ලෙස සකසනු ලබන්නා එයටම ආවේණික වූ ගති ලක්ෂණවලින් හෙබි පුද්ගල ප්‍රභේදයකි. ඕනෑම මානව සමාජයක් තම රටට, සමාජයට අනාගත තරුණ පිරිස දෙස බලනුයේ බලාපොරොත්තු සහගත බැල්මකිනි. තරුණයා, යෞවනයා නැතහොත් Adolecent යන ඉංග්‍රීසි වචනයෙන් යෞවනයා, ගැටවරයා යන පුද්ගල ප්‍රභේදය අදහස් වේ. Adolesence යන පදයෙහි වර්ධනය වන පරිණතිය කරා වර්ධනය වන යන අර්ථය ගම්‍ය වේ. යෞවුන් දිවිය මිනිස් ජීවිතයේ අභිමතම අවධිය වන අතර යෞවනයට සාපේක්ෂව අවකාශයන් සංකීර්ණ වේ. එමනිසා සමස්ත ලෝකයේම තරුණයා පොදුවේ ගෙවෙන්නේ ඔවුන්ගේ අවකාශයන්ගේ බලාපොරොත්තු සමගය වේ. එය වඩාත් විශේෂ කාරණය වන්නේ දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික ව්‍යුහයන් තුළ පමණි.

මානව සමාජ පරිණතිය තුළ මිනිසා දියුණුලීව සාර්ථක කර ගැනීමට අපේක්ෂා කරන අවකාශ මත පදනම්ව ආයතනික ව්‍යුහය ගොඩනැගෙන අතර ඒ තුළ ජනමාධ්‍ය නමැති ආයතනය ප්‍රබල වේ. 20 වන සියවසේ සිදු වූ සන්නිවේදන මාධ්‍යයන්ගේ හා තොරතුරු තාක්ෂණයේ වේගවත් වර්ධනයත් සමග සමස්ත සමාජයම සන්නිවේදන බල ආධිපත්‍යයට ලක් විය. ඒ තුළ ගුවන් විදුලියේ සම්ප්‍රදායික වර්තමාන විද්‍යුත් සන්නිවේදන දියුණුවේ මූලික අඩිතාලමයි.

ජනමාධ්‍ය අතර ගුවන් විදුලි මාධ්‍ය සුවිශේෂ වන්නා සේම මානව සමාජය තුළ යෞවුන් ප්‍රජාව විශේෂිත වීම ද එම විචල්‍යයන් දෙක අතර පවත්නා අන්තර් සම්බන්ධතාවය කෙරෙහි වැඩි

අවධානය යොමු කිරීමට හේතු විය. නූතන ලෝකයේ ගුවන් විදුලි මාධ්‍යයේ නව ප්‍රවණතාවය නම් සුදෙක් එය තරුණයන්ගේ මෙවලමක් බවට පත්ව තිබීමයි.

ඒ අනුව මාගේ පර්යේෂණ මාතෘකාවට අදාළ සංකල්ප ගොඩනැගීම සඳහා පාදක වූයේ වත්මන් සමාජ කතිකාව තුළ නිරන්තරයෙන් මතභේදාත්මකව කතාබහට ලක්වන යෞවනයේ අවශ්‍යතා නියෝජනය වීම පිළිබඳ ගුවන් විදුලි මාධ්‍ය අතර පවතින සබඳතාවයේ ස්වරූපයයි.

ඒ අනුව සුලබ මාතෘකාවන්ගෙන් තරමක් වෙනස් ගැටලුවක් ඔස්සේ අධ්‍යයනය කිරීමට තීරණය කළෙමි. ඊට හේතුව මෙම මාතෘකාව යටතේ ප්‍රමාණවත් තරම් පර්යේෂණ සිදු නොවීමයි. ගුවන් විදුලි මාධ්‍යයේ එක් සුවිශේෂී ප්‍රභේදයක් ඉලක්ක කර ගනිමින් එකී ප්‍රභේදයේ අනන්‍යතාව හා එකී අවශ්‍යතාව පිළිබඳ ගුවන් විදුලි මාධ්‍යයේ භාවිතාව කෙබඳු දැයි සොයා බැලීම පරමාර්ථය විය.

ගුවන් විදුලිය මාධ්‍ය යෞවනයේ සැබෑ ස්වරූපය හා එකී අවශ්‍යතාවයන්ගේ නියම ස්වරූපය හඳුනාගෙන තිබේද? වත්මන් ගුවන් විදුලියේ නිරූපිත යෞවනය සහ එකී අවශ්‍යතා කවරාකාරද? මේ හරහා සැබෑ තරුණ අවශ්‍යතා ඉස්මතුවේද? ඒ සඳහා ඇති සීමාවන් බාධක මොනවාද? ගුවන් විදුලි මාධ්‍යයෙන් සිදුවිය යුතු වෙනස්කම් කෙබඳුද? ගුවන් විදුලි වැඩසටහන්වල ස්වරූපය මොනවාද? යන්න කෙරෙහි අවධානය යොමු විය. යෞවනය හා එකී අවශ්‍යතාවන් නියෝජනය කිරීමේ ගුවන් විදුලිය සතු කාර්යභාරය අධ්‍යයනය කිරීමෙන් අනාවරණය කර ගැනීමට අපේක්ෂා කරන ලද්දේ යෞවනය සහ එකී අවශ්‍යතා ගුවන් විදුලි මාධ්‍ය උකහා ගෙන ඇත්තේ කෙසේද එම උකහා ගැනීම ගුවන් විදුලි මාධ්‍ය තුළින් සමාජය වෙත ගෙන ඒමේදී වැඩසටහන් සකස් කරන ලද්දේ කෙසේද යන්නයි.

ඕනෑම පර්යේෂණ ප්‍රතිඵලයකින් අවසානයේ සිදුවන්නේ එය සමාජයේ අදාළ අවස්ථාවට ස්ථානයට ආදේශ කිරීම සඳහා අවශ්‍ය නිගමන යෝජනා ගොඩනැගීමෙහිලා ගලපා ගැනීමයි. මෙම පර්යේෂණය තුළින් ද සිදු වන්නේ තරුණයන් යන විශේෂිත පුද්ගල ප්‍රභේදය තුළින් අධ්‍යයනය කරන්නේ ගුවන් විදුලි මාධ්‍යයෙහි වැඩ සටහන් තුළින් තරුණ අවශ්‍යතා නියෝජනය කිරීම පිළිබඳවයි.